


# ලෝකාලෝකය

**2017 දෙසැම්බර් - 2018 පෙබරවාරි කලාපය**

## 2018 නව වසර
## ඔබ සැමට දෙවියන්වහන්සේගේ
## කරුණාව බහුල වේවා !

**පළමුවෙනි නැවත නැගිටීමට පංගුකාරකම ඇති තැනැත්තා වාසනාවන්තය, ශුද්ධය. ඔවුන් කෙරෙහි දෙවැනි මරණයට බලය නැත්තේය. ඔව්හු දෙවියන්වහන්සේගේත් ක්‍රිස්තුස්-වහන්සේගේත් පූජකයෝව, උන්වහන්සේ හා සමඟ අවුරුදු දහසක් රජකම් කරන්නෝය.**

**(එළිදරව් 20:6)**

කවරය : යේරුසලම් නගරය.

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.

දුරකථන අංක : 011 2581901

## ළමා පිටුව

# යේසුස්වහන්සේ

ආදර දුවේ, පුතේ ඔයාලා කැමතිම පාසැල් නිවාඩුවත් එක්කම නත්තල ළඟ ළඟම එනවා නේද? නත්තල කිව්වම මොනවද ඔයාලට මුලින්ම මතක් වෙන්නේ? ඔව්, තෑගි බෝග, ඇඳුම් පැළඳුම්, ලස්සන සැරසිලි, පාට පාට විදුලි බුබුළු වගේම රසම රස කෑම වර්ග නේද? ඔයාලා දැකලා තියෙනවද සමහර ගෙවල්වල ලස්සනට සරසල තියෙන නත්තල් ගස් සහ පුංචි බබෙක් ඉන්න ගවමඩුව. හරිම ලස්සනට සරසල තියෙනවා නේද? පුංචි ඔයාලා දන්නවද මේ ලස්සන හැමදේටම වඩා ගොඩක් වටින දේ තමයි යේසුස්වහන්සේ. නමුත් හරිම කණගාටුයි බොහෝ දෙනාට නත්තල සමරන කොට යේසුස්වහන්සේව අමතක වෙනවා. ඔයාලා දන්නවා නේද "නත්තල" කියන්නේ මොකක්ද කියලා. ඔව් දුවේ පුතේ, නත්තල ලෙස ලෝකයේ මිනිසුන් සමරන්නේ යේසුස්වහන්සේගේ උපන්දිනය. මිනිසුන් බොහොම ජයට, කමින් බොමින් ප්‍රීති වෙමින් නත්තල සමරනවා නේද? ඔන්න දුවේ පුතේ, මම අද ඔයාලට කියලා දෙන්නේ මේ සාමයේ කුමාරයාගේ කතාව. ඉතින් පුංචි ඔයාලා මේ කතාව කියවා යේසුස්වහන්සේ කවුද කියලා හොඳින් තේරුම් ගන්න ඕනේ.

දෙවියන්වහන්සේ මේ ලෝකය මවා පොළොව පාලනය කිරීමට මනුෂ්‍යයන්ට භාර දුන්නා. ඒත් මිනිස්සු යක්ෂයාගේ වචනයට රැවටිලා දෙවියන්වහන්සේට අකීකරු වෙලා පව් කලා. දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් ගැන දුක්වෙලා ඔවුන්ව මේ පව්කාර තත්වයෙන් බේරගන්න තීරණය කළා. ඒකට තිබුණේ එකම විසඳුමයි. ඒ කිසිම පවක් නැති කෙනෙකුගේ පූජාවීම හැම මනුෂ්‍යයෙක්ම පව් කරලා තිබුන නිසා දෙවියන්වහන්සේ තීරණය කලා තමන්ගේ එකම පුතා මේ මනුෂ්‍යයන් වෙනුවෙන් මේ ලෝකයට එවන්න. යේසුස්වහන්සේත් තමන්ගේ පියාණන්ගේ තීරණයට කීකරු වුණා. ඒ ගැන ශුද්ධ බයිබලයේ මෙලෙස සඳහන් වෙනවා. **"පව්කාරයන් ගලවන්නට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආ සේක යන කීම විශ්වාස වූ සර්වප්‍රකාරයෙන්ම පිළිගත වූ කීමක්ය" (1 තිමෝති 1:15)**

ඉතින් දුවේ පුතේ, ඉශ්‍රායෙල් රටේ නාසරෙත් නුවර ජීවත් වුන බොහොම යහපත් "මරියා" නම් ස්ත්‍රියගේ කුසින්, බෙත්ලෙහෙම් නුවරදී යේසුස්වහන්සේ මේ ලෝකයේ උපත ලැබුවා. යේසුස්වහන්සේ ඉපදුන විට අහසේ දීප්තිමත් තාරකාවක් පෑවුවා. දේවදූතයන් අහසෙහි ඉඳ දෙවියන්වහන්සේට ප්‍රශංසා ගීතිකා ගායනා කළා. මරිය තුමිය බිළිඳු යේසුස්වහන්සේව තියන්න ඔවුන් නැවතී සිටි ගෙදර ඉඩ නැති නිසා උන්වහන්සේව ගවයන් කන ඔරුවක තැබුවා කියලා බයිබලයේ සදහන් වෙනවා. "ඈ කුළුදුල් පුත්‍රයා වදා, රෙදිවලින් ඔතා නවාතැන්ගෙයි ඔවුනට ඉඩ නොතිබුන බැවින් ගවයන් කන ඔරුවක තැබුවාය" (ලූක් 2:7). යේසුස්වහන්සේගේ උත්පත්ති කථාව ඔයාලට බයිබලයේ අලුත් ගිවිසුමේ මතෙව්, මාර්ක්, ලූක්, යොහාන් කියන සුභාරංචි පොත්වලින් තව දුරටත් කියවන්න පුළුවන්.

ඉතින් දුවේ පුතේ, ඔයාලා හැම අවුරුද්දකම ඔයාලගේ උපන්දිනය සමරනවා නේද? හැම උපන්දිනයකම ඔයාලා එකම විදිහද? චූටි බබෙක් වගේ හැමදාම ඉන්නවද? නැහැ නේද? අවුරුද්දෙන් අවුරුද්ද ඔයාලා ලොකු වෙනවා. චූටි කාලේ ඔයාලා ඇඳපු ඇඳුම් තාමත් අඳින්න පුළුවන්ද? බැහැ නේද? ඒ වගේම යේසුස්වහන්සේත් අවුරුද්දෙන් අවුරුද්ද උස්මහත් වෙලා හොඳට ඉගෙන ගත්තා. **"යේසුස්වහන්සේ ප්‍රඥාවෙන් හා උස මහතින්ද, දෙවියන්වහන්සේගේත්, මනුෂ්‍යයන්ගේත්, කරුණාවෙහිද වැඩුණු සේක" (ලූක් 2:52)** යේසුස්වහන්සේ මේ ලෝකයට ආවේ පව්කාරයන්ව ගළවන පිණිස කියලා මම මුලින්ම ඔයාලට කිව්වා මතකයි නේද? ඒ වගේම යේසුස්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රී රුධිරය වගුරවා මනුෂ්‍යයන්ගේ පාපයෙන් ඔවුන්ව ගළවා ගත්තා. "...... **උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේගේ ලේ ද, සියලු පාපවලින් අප පවිත්‍ර කරන්නේය..." (1 යොහාන් 1:7).** දැන් උන්වහන්සේ පියාණන්වහන්සේ සමඟ ස්වර්ග යේ වැඩ වසනසේක. තව දුරටත් ගව ඔරුවක තැබූ බිළිදු යේසුස් කෙනෙක් මතක් කර ගැනීමෙන් ප්‍රයෝජනයක් නැති බව පුංචි ඔයාලට දැන් පැහැදිලියි නේද?

දුවේ පුතේ, පොඩ්ඩක් කල්පනා කරන්න. ඔයාගේ උපන්දිනය ඔයාව අමතක කරලා අනෙක් අය විතරක් සතුටින් සැමරුවොත් ඔයාට මොකද හිතෙන්නේ. ඔයාගේ පුංචි හිතට ගොඩක් දුක හිතෙනවා නේද? ඒ වගේමයි දරුවනේ අපිත් යේසුස්වහන්සේ නැතුව උන්වහන්සේගේ උපන්දිනය සැමරුවොත් උන්වහන්සේත් දුක් වෙනවා. දැන් ඔයාලා දන්නවනේ ඇයි යේසුස්වහන්සේ මේ ලෝකයට ආවේ කියලා. නත්තලේ සැබෑ අර්ථය නම් සාමයේ කුමාරයා මේ ලෝකයට ආව උතුම් අරමුණ සිහිකරමින් උන්වහන්සේව විශ්වාස කර අදහා, උන්වහන්සේ වෙතින් පැමිණෙන සැබෑ පව්කමාව ලබා ගැනීම.

දුවේ පුතේ, ඔයාලට දැන් නත්තලේ සැබෑ කතාව පැහැදිලියි නේද? යේසුස්වහන්සේ ඇයි මේ ලෝකයට ආවේ කියලත් දැන් තේරෙනවා නේද? ඉතින් ඔයාලා හැමෝටම නත්තලේ ප්‍රීතිය සමරමින් යේසුස්වහන්සේව සැබෑ ලෙසම ඔබේ ජීවිතයේ කුමාරයාණන් නොහොත් රජතුමා කර ගන්නට දෙවියන්වහන්සේගේ කරුණාව ලැබේවා.

**මීට ආදර,**
**- ශෂිලා නැන්දා -**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ගැළවීම.

## ගැළවීමේ ශ්‍රේෂ්ඨත්වය.

දේව දරුවන් බවට පත්වීම යනු මනුෂ්‍යයෙකු විසින් ලබා ගත හැකි උතුම්ම උරුමයකි. එනම් ගැළවීම ලැබීම යනු සැබෑම වාසනාවකි. යම් කෙනෙකු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගෙන ගැළවීම ලබන්නේද ඒ පිටුපස තිබෙන්නේ මහෝත්තම දෙවියන්වහන්සේගේ හස්තයයි.

## 01 තෝරා ගැනීමේ ශ්‍රේෂ්ඨත්වය - එපීස 1:4

දේව දරුවන් බවට පත්වීමෙහිලා පළමු කාරණය වන්නේ ඒ සඳහා තෝරා ගැනීමයි. එපීස 1:4 අනුව ලෝකය මැවීමට ප්‍රථම ක්‍රිස්තුස්වහන්සේ තුල අප තෝරාගත් බව පවසයි. මේ ලෝකයේ සිටිය හා සිටින හෝ මතු සිටින සියලු දෙනාටම දේව දරුකම ලබා ගත නොහැක. මෙම වරප්‍රසාදය ලැබෙන්නේ දෙවියන්වහන්සේ විසින් කලින් නියම කරනු ලැබූ අයට පමණි. යොහාන් 15:16 අනුව දෙවියන්වහන්සේ විසින්ම තෝරා ගනු ලැබූ අයටයි. ඒ තෝරාගැනීම වනාහී,

I දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍ය කැමැත්තට අනුව තෝරා ගැනීම (යොහාන් 15:16).

II දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍ය බලය කරණකොට ගෙන තෝරා ගැනීම (ගීතාවලිය 118:15 / ක්‍රියා 11 :21).

III දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍ය අභිප්‍රායන් සහිතව තෝරා ගැනීම (1 ප්‍රේත්‍රුස් 2:9).

එබැවින් දේව වචනය අපට පෙන්වාදෙන සත්‍ය නම් ගැළවීම ලැබීම යනු මහෝත්තම දෙවියන්වහන්සේගෙන් ලැබූ වරප්‍රසාදයක් හා තෑග්ගකි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට අයිති සෑම දෙනෙකුම දෙවියන්වහන්සේ විසින්ම තෝරාගත් අයව සිටිති. එම තෝරා ගැනීම පිටුපස දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍ය කැමැත්ත, බලය හා අභිප්‍රායක් තිබේ. ඔබ දැනටත් ගැළවීම ලබා නැවත ඉපදීම නැමැති ඇතුලාන්ත අත්දැකීම ලබා ඇත්නම් ඔබ සමඟ දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ සිටින බව නිතර සිහි තබා ගන්න.

## 02 මිදීමේ ක්‍රියාවලියේ ශ්‍රේෂ්ඨත්වය - එපීස 1:7

දෙවියන්වහන්සේ අපට ප්‍රධානය කළ ගැළවීමේ ශ්‍රේෂ්ඨත්වයේ දෙවැනි කරුණ වන්නේ අපගේ පව්වලින් අප මුදවා ගැනීම දියත් කල ක්‍රියාවලිය නොහොත් මෙහෙයුමයි. නියම පරම්පරාවේදී, නියම කාලයේදී අප ස්වාමීවූ යේසුස්වහන්සේ අදහාගන්නා පිණිස පෙර නියමකල බව බයිබලය පවසයි. සියල්ලෝ පව්කාරයන් වන ලෝකයා උදෙසා දෙවියන්වහන්සේ මුදවා ගැනීමේ මෙහෙයුම් සැලසුම් කර ක්‍රියාත්මක කළ සේක. දෙවියන්වහන්සේගේ ස්වභාවයට හා ධර්මිෂ්ඨකමට අනුව ලේ වැගිරීමක් නොමැතිව පව් සමාවක් නැත. (හෙබ්‍රෙව් 9:22) ලෝකයාගේ ගැළවීම උදෙසාම

මෙලොවට තම පුත්‍රයාණන් එවීම තුලින් මෙම මෙහෙයුම ආරම්භ විය. මේ සියල්ල දෙවියන්වහන්සේ තම හදවතේ ලෝකයාට ඇති ප්‍රේමය කරණකොට ගෙන සියල්ල සිදුකරනු ලැබූ සේක. මනුෂ්‍ය සංහතිය පාපයෙන් ගලවා ගැනීමට බලපෑ කාරණා 3ක් ප්‍රධාන වශයෙන් බලපායි. අදත් එසේමය. යම් කෙනෙකුට දේවදරුවෙකු බවට පත්කරන ප්‍රධාන නියෝජිතයන් තුන් දෙනෙකි.

**01. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ - (යොහාන් 3:16-17).**
**02. දෙවියන්වහන්සේගේ වාක්‍යාණෝ - (යොහාන් 3:5).**
**03. දෙවියන්වහන්සේගේ ආත්මයාණෝ - (යොහාන් 3:5).**

දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ කුරුසියේ මරණය කරණකොට ගෙන අපගේ පාපයේ වන්දි මිලය ගෙවූ සේක. දේව වචනය කරණකොටගෙන එය අපට එළිදරව් කරන අතර ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන එය ඇදහිල්ලෙන් අපට ඒත්තු ගන්වන අතර උන්වහන්සේ විසින්ම උන්වහන්සේගේ මරණය තුලට හා ශරීරය තුලට අප බෞතීස්ම කර දේව දරුවන් බවට අපව පත් කරයි. මෙය ඇදහිල්ලෙන් ගැළවීම ලැබීම නොහොත් ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කොට ගණන් ගනු ලැබීම ලෙස බයිබලය අර්ථ දක්වයි.

## 03 අපගේ සදාකාලික ආරක්ෂාවේ ශ්‍රේෂ්ඨත්වය - එපීස 1:14

මෙය මුද්‍රාකිරීම ලෙසද හඳුන්වයි. දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබ, මුදවාගත් අය දෙවියන්වහන්සේ විසින්ම සදාකාලයටම ආරක්ෂා කර ගැනීමේ ඒකායන අභිප්‍රායක් හා සැලසුමක් උන්වහන්සේ සතුය. රෝම 8 වැනි පර්විච්ඡේදය ඉතාමත් ප්‍රවේසමෙන් හා සැලකිලිමත්ව කියවා බලන්න. එහි දෙවියන්වහන්සේගේ හදවතෙහි ජනිත වී ඇති අප පිළිබඳ සදාකාලික ආරක්ෂාව ලියවී ඇත. අප උන්වහන්සේට අයිති බවට උන්වහන්සේගේ මුද්‍රාව අප ආත්මය මත තබා ඇත. එහි අර්ථය නම්

I **දෙවියන්වහන්සේගේ අවසාන තීරණය**
II **දෙවියන්වහන්සේගේ අයිතිකාරත්වය.**
III **දෙවියන්වහන්සේගේ ආරක්ෂාව.**

උන්වහන්සේ අප තෝරා ගෙන, පවිත්‍ර කොට, උන්වහන්සේට වෙන් කර ගත් බවට තීන්දුව සෑම ඇදහිලිවන්තයෙකු සම්බන්ධයෙන්ම උන්වහන්සේ දැනටමත් ගෙන ඇත. එමෙන්ම අප සෑම කෙනෙකුගේම අයිතිකාරයා බවටත් නිරන්තරයෙන් අපගේ ගැළවීම ආරක්ෂා කිරීමටත් උන්වහන්සේ බැඳී සිටින බවට සහතික කිරීම යනු මුද්‍රා කිරීමයි. එමගින් අප උන්වහන්සේගෙන් කිසිවෙකුට උදුරාගත නොහැක. ගැළවීම කිසිදා නැතිවන්නේද නැත.

බයිබලයේ සඳහන් මෙවැනි සත්‍යතාවයන් අප ඉගෙනීමටත්, එය විශ්වාස කිරීමටත්, ඒ මත ජීවත්වීමටත් උන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා. ලබන්නාවූ නව වසර තුල ඔබ සැමට දෙවියන්වහන්සේගේ කරුණාව අධික වේවා.

**- එස්. මෙත්තානන්ද -**
**077 8 813 197**

# නපුරෙන් පරාජය නොවූ යෝසෙප්

**උත්පත්ති 37**වෙනි පරිච්ඡේදයෙන් තම කථාව ආරම්භ කරන යෝසෙප් අපූරු ගති ලක්ෂණ වලින් හෙබි තරුණයෙකි. දෙමව්පියන්ගේ හා වැඩිහිටියන්ගේ අවවාද, දැනමුතුකම් නුරුස්සන්නාවූ තමන්ගේම කැමැත්ත කිරීමට කැමති කාලයකි තරුණ විය. ඔහුව අපට හඳුන්වා දෙන්නේ වයස 17ක් වූ තරුණයෙකු ලෙසය. යෝසෙප් තම වැඩිමහල් සහෝදරයන්ගේ නපුරු ආදර්ශ නිසා නපුර කිරීමට යොමු වූයේ නැත. නපුර හෝ පාපය ඔහු ප්‍රතික්ෂේප කලේය. එම නිසා වැඩිමහල් සහෝදරයන් කළ ක්‍රියා ඔහු අනුගමනය කළේ නැත. අවශ්‍යනම් තම සහෝදරයන් අනුගමනය කිරීමට ඔහුට හොඳටම ඉඩකඩ තිබුණි. ඔවුන්ගේ අනුබලයද ඔහුට ලැබෙන්නට තිබුණි. එහෙත් ඔහු එම පාපිෂ්ඨ ක්‍රියාවලට ද්වේශ කලේය. **උත්පත්ති 39:10** යෙහි සඳහන් පරිදි පසුකලෙක ලිංගික පාප සඳහා වූ පරීක්ෂාවකින්ද ඔහු ජයගත් අයුරු සඳහන්ව ඇත. තරුණවියේදී තෘෂ්ණාවට පෙළඹීම සාමාන්‍යයෙන් සුලභය. අද ලෝකයේ එය පිළිගන්නාවූ සාමාන්‍ය දෙයක් බවට පත් වී තිබීම කණගාටුවට කරුණකි. එහෙත් යෝසෙප් ඒවා දුටුවේ දෙවියන්වහන්සේට විරුද්ධව කරන නපුරු පාපිෂ්ඨ ක්‍රියා ලෙසටය.

යොසෙප් තම වැඩිමහල් සොහොයුරන්ගේ නපුරු ක්‍රියා දැක නොදැක්කා මෙන් සිටියේවත් සඟවාගෙන සිටියේවත් නැත. වගකිව



යුතු තැනැත්තාට ඒ බව දැනුම් දිය යුතු යැයි ඔහු තීරණය කළේය. ඒ අනුව ඔවුන්ගේ පාපිෂ්ඨ ක්‍රියා ගැන නිර්භීතව පියාට දැනුම් දුන්නේය. **(උත්පත්ති 37:2)** ඔහුගේ සිතේ ආශාව හා බරක්ව තිබෙන්නට ඇත්තේ ඔවුන්ව එම නපුරු මාර්ගයෙන් බේරා ගැනීමට විය හැක. නපුරට ද්වේශ කළ ඔහු ඊට විරුද්ධව ක්‍රියාත්මක විය. එය ඔහුගේ යහපත් ගති ලක්ෂණයකි. මේ හේතුව නිසා යෝසෙප් තමාගේ හා දෙවියන්වහන්සේගේ විශේෂ කරුණාව ලැබූ තරුණයෙක් විය **(උත්පත්ති 37:3,39:2,21,23)**. ස්වාමින්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දේ කරමින් උන්වහන්සේගේ ආඥා රක්ෂා කළ විට උන්වහන්සේගේ ප්‍රේමයෙහි පැවතීමේ භාග්‍යය අපට ලැබේ **(යොහාන් 15:10).** සර්ව පරාක්‍රම වූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය තුළ පවතින්නට හැකි වීම කෙතරම් අපූර්ව වූ අත්දැකීමක්ද?. නැවතී මේ ගැන ටිකක් සිතා බලන්න. ඔහු උන්වහන්සේගේ ප්‍රේමයේ හා කරුණාවේ පැවතුන විට ඔහු

කරණකොටගෙන අනිත් අයටද ආශිර්වාද ලැබුණේය **(උත්පත්ති 39: 3-5, 39:23, 40:8).** පළමුව පෝතිඵර්ටද, පසුව හිරගෙදර ප්‍රධානියාටද, ඉන්පසු හිර ගෙදර සිටි කුසලාන දරන්නාටද, ඊටත් පසුව ඵාරාවෝ රජුට හා ඔහුගේ රට වැසියන්ටද, අවසානයේදී යෝසෙප්ගේම පවුලටද එම ආශිර්වාද ගලා ගියේය. ඔහු බොහෝ දෙනාට ආශිර්වාදයේ උල්පතක් බවට පත් වූවා යැයි කීම අතිශයෝක්තියක් නොවේ. අන් අයට ආශිර්වාදයක් වීමට ඔහුට හැකි වූයේ ඔහු ජීවත් වූ පරිසරය, වාතාවරණය, ස්ථානය, ඉතාමත්ම යහපත්ව හෝ සතුටුදායක තත්වයක පැවති විටදී නොවේ. ඊට හාත් පසින්ම වෙනස් කටුක වූ, පීඩාකාරී, නින්දා සහගත අත්දැකීම් සමුදායක් තුලිනි. ඔබත් සමහර විට අන් අයට ආශිර්වාදයක් වීමට ආශා කරනවා ඇත. එසේනම් නිරතුරුවම නපුරට ද්වේශ කරමින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා කරුණාව ලැබ ගන්න. මෙය සැබවින්ම ඔබට භුක්ති විඳිය හැකි සුවිශේෂී අත් දැකීමකි.

යෝසෙප්ගේ මුළු ජීවිත කථාව පුරාවටම අපට පැහැදිලි ලෙස දැක ගත හැකි ප්‍රධාන වූත්, වැදගත්මවූත් කාරණය නම් දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යයි. ස්වාමින්වහන්සේ යම් දෙයක් කරන්නට සිතන සේක් ද, එය ඉෂ්ඨවනතුරු නොනවතින සේක. උන්වහන්සේගේ පරමාධිපත්‍යයට විරුද්ධව සිටින්ට කිසිවෙකුට නොහැකිය. උන්වහන්සේ තෝරාගත් මනුෂ්‍යයා හෝ ස්ත්‍රිය කෙරෙහි උන්වහන්සේගේ අභිප්‍රාය ඉෂ්ඨවන තුරු උන්වහන්සේ ක්‍රියා කරන සේක. යෝසෙප්ගේ සහෝදරයෝ ඔහුගේ ස්වප්නය සම්බන්ධව ඊර්ෂ්‍යාවෙන් ඔහුව මරණයට පත් කරන්ට තරම් සාහසිකව සිටියද **(උත්පත්ති37:8)** යෝසෙප්ගේ පියා යාකොබ් ද, ඔහු දුටු ස්වප්නයට විදරුද්ධව ආකල්පයක් දැරුවද ස්වාමින්වහන්සේගේ අර මුණ ඉටු වීම එයින් වැලකුනේ නැත. අපගේ ජීවිත සම්බන්ධවද අප ඉගෙන ගත යුතු ඉතාමත් උචිත වූ පාඩමකි මෙය. අපගේ ජීවිත වලද, ක්‍රියා කරන්නේ එම පරමාධිපත්‍ය වූ දෙවියන්වහන්සේමය.


අනික් අතින් බලන කල යෝසෙප්ගේ ජීවිතය තුල ස්වාමින්වහන්සේගේ එම අභිප්‍රාය ඉෂ්ඨ කරනු ලබන පිණිස ඔහුට ඉතාමත් කටුක වේදනාකාරී හා පීඩාකාරී අත්දැකීම් තුලින් යාමට ඉඩ හැරිය සේක **(උත්පත්ති 37:23 - 28, 39:20, 42:21).** ඔහුගේ තරුණවිය පුරාවටම ඔහුට සිදු වූයේ දුක්ඛිත අත්දැකීම් තුලින් ගමන් කරන්නටය. ස්වාමින්වහන්සේ එසේ වන්නට ඉඩ හල සේක. අපට නොතේරෙන, අප නොදන්නා වේදනාකාරී අත්දැකීම් තුලින් උන්වහන්සේ අපවද ගෙන යන සේක. එහෙත් අවසානයේදී යෝසෙප්ගේ ජීවිතයේ වූ අයුරින් උන්වහන්සේගේ කැමැත්ත සහ අභිප්‍රාය අපගේ ජීවිත වලද, ඉෂ්ඨ කරනු ලබන්නේය. අප කළ යුතු වන්නේ උන්වහන්සේගේ බලවත් හස්තයට

යටත්ව සිටීමයි. අපට සිදුවන්නාවූ, අප යන්නාවූ සෑම අත්දැකීමක් ගැනම උන්වහන්සේ හොදාකාරයෙන් දන්නා සේක. යෝසෙප් ඒ බව දැන සිටියේය **(උත්පත්ති 39:3-4, 21:23).** එම නිසා ස්වාමින්වහන්සේ ඔහු උදෙසා අවසානයේදී තබා තිබූ ප්‍රතිඵලය විශ්වාස කරමින් ඉවසිලිමත්ව සිටියේය. එක සමාන ස්වප්න දෙකක් දකින්නට සැලැස්වූ ස්වාමින්වහන්සේ විශ්වාසවන්ත බව ඔහු විශ්වාස කළේය **(හෙබ්‍රෙව් 10:23).** ස්වාමින්වහන්සේද, එම ස්වප්න සැබෑවෙන්ට සැලැස්වූ සේක.

යෝසෙප්ගේ ජීවිතය මුළුල්ලේම සිදුවූ සියළු සිදුවීම් තුලින් යෝසෙප්ගේ සහෝදරයන්ද, යෝසෙප්ද දිව්‍යමය වූ සත්‍යතාවයන් දැනගත්හ. එම සත්‍යතාවයන් අපගේ ජීවිතයෙහිද, ඉතා වැදගත් ලෙස සැලකිය යුතු ආත්මික ප්‍රතිපත්තීන් වේ. යෝසෙප්ගේ සහෝදරයෝ තමන් කළා වූ නපුරු දුෂ්ඨ ක්‍රියාවන් ගැන අවසානයේදී පසුතැවිලි වූහ. **(උත්පත්ති 12:21)** ඉන්පසු ඔවුහු එම පාප කියා දී සමාව ලබා ගත්හ **(උත්පත්ති 50:17).** එසේම ඔවුහු ස්වාමින්වහන්සේගේ කැමැත්ත හා අභිප්‍රාය පිළිගෙන ඊට යටත් වූහ. අධිපතිකම් කිරීම පටන්ග ැන්මේදී ඔවුන් පිළිගත්තේ නැති නමුත් අවසානයේදී යෝසෙප්ගේ අධිපතිකමට, පාලන බලයට යටත් වීමට ඔවුන් ඉගෙනගත්හ. ඔවුන් යෝසෙප් ඉදිරියෙහි වැටී අපි ඔබගේ මෙහෙකරුවෝ යැයි පිළිගත්හ **(උත්පත්ති 50:18).**

යෝසෙප් ඉගෙන ගත් ආත්මික ප්‍රතිපත්ති වන්නේ ඔහුගේ සහෝදරයන්ට නපුරට නපුර නොකිරීම, පළි නොගැනීම, ඔවුන්ට බඩගිනි හා පිපාස වූ විට කෑම බීම සපයා දීම **(උත්පත්ති 47:12)** වැනි දෑය. යහපත්කමින් නපුරුකම පරාජය කර සමාව දීම යන ආත්මික ප්‍රතිපත්ති ඔහු තුලින් පැහැදිලිව පිළිඹිබු විය **(රෝම 12:17-21).** ඔහුගේ ජීවිතයේ සිදුවූ සෑම කාරණයක් තුලම ස්වාමින්වහන්සේගේ හස්තය තිබූ බවත් ඒ සෑම දේම සිදු වූයේ ඔහුගේ හා ඔහුගේ පවුලේ අයගේ යහපත උදෙසා බවත් ඔහු මුළුසිතින් විශ්වාස කළේය. මෙලෙසම අපිත් මෙම ආත්මික පාඩම් ඉගෙන ගෙන අපේ ජීවිත වලද, අප යන්නාවූ සෑම අත්දැකීමක් සිදුවීමක් තුල ස්වාමින්වහන්සේගේ බලවත් හස්තය තිබෙන බව හා එම සිදුවීම් වලට ස්වාමින්වහන්සේ ඉඩ හරින්නේ අපගේ යහපත පිණිස පමණක්ම බව විශ්වාස කරමු **(රෝම 8:28).** නපුරුකමෙන් පරාජය නොවී යහපත්කමින් නපුරුකම පරාජය කරමු.

**- ඈන් ජයසුන්දර -**



# දෙවියන්වහන්සේව ප්‍රසන්න කරන්න ඔබට පුළුවන්ද?

සර්වබලධාරී දෙව්පියාණන්වහන්සේගේ ප්‍රේමය ගැන ඔබ දන්නවාද? උන්වහන්සේගේ ප්‍රේමයේ තරම ඔබට වැටහෙනවාද? **"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නාවූ සෑම දෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහාන් 3:16)**. උන්වහන්සේ අපට ප්‍රේම කළේ ඒ ආකාරයටය. දෙවියන්වහන්සේ බලාපොරොත්තු වෙනවා අපිත් උන්වහන්සේට ප්‍රේම කරයි කියා. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මුළු ප්‍රේමයෙන් අපව ප්‍රසන්න කරන්නට බලාපොරොත්තුව සිටින සේක. එලෙසම අපිත් මුළුමනින්ම උන්වහන්සේව ප්‍රසන්න කරයි කියා උන්වහන්සේද බලාපොරොත්තුව සිටින බව ඔබ දන්නවාද? උන්වහන්සේ ඔබට ප්‍රේම කරන නිසා ඔබ උන්වහන්සේ ප්‍රසන්න කළ යුතුයි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන දෙව්පියාණන්වහන්සේ ප්‍රසන්නව සිටින සේක. **"මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි. අහසෙන් හඬක් විය" (මතෙව් 3:17).** උන්වහන්සේ එම ප්‍රසන්න භාවයට හේතුව "මා එවූ තැනැන්වහන්සේ මා සමඟ සිටින සේක. උන්වහන්සේ මා තනියම සිටින්නට නෑරිය සේක. **මක්නිසාද උන්වහන්සේට ප්‍රසන්න වූ දේවල් මම නිතරම කරමි කී සේක" (යොහාන් 8:29)**. "මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ".....

**"මක්නිසාද මාගේම කැමැත්ත නොව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත සොයමි" (යොහාන් 5:30).** ඉහත බයිබල් පද වලට අනුව යේසුස්වහන්සේ මනුෂ්‍යාකාරයෙන් ජීවත්වන විටත් දෙවියන්වහන්සේව ප්‍රසන්න කළ බවයි. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තම පුද්ගලික ගැළවුම්කරු ලෙස පිළිග න්නා සෑම කෙනෙකුම මෙලෙස දෙව් පියාණන්ව ප්‍රසන්න කළ යුතුයි. මක්නිසාද යේසුස්වහන්සේ මේ ලෝකයේ මනුෂ්‍යයෙක් ලෙසත් දෙවියන්වහන්සේගේ පුත්‍රයකු ලෙසත් ජීවත් වූ සේක. මක්නිසාද අපිත් උන්වහන්සේව ප්‍රසන්න කලයුතු වන අතර එයට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ඇදහිලිවන්ත අපට අවස්ථාවක් නැත. මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ පරම ආදර්ශයව සිටින සේක. ඇදහිලිවන්ත අපට දෙවියන්වහන්සේව ප්‍රසන්න කළ හැකි ආකාරයන් මොනවාදැයි සොයා බලමු.

## 01 නිතරම උන්වහන්සේට නමස්කාර කිරීමෙන්.

නික්මයාම 8:1 - **"එවිට ස්වාමින්වහන්සේ මෝසෙස්ට කථාකොට ඵාරාවෝ වෙතට ගොස් ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක්කැයි ඔහුට කියාපන්න - මට මෙහෙකරන පිණිස මාගේ සෙනඟ යන්ට හරින්න".**

නික්මයාම 9:1 - **"තවද ස්වාමින්වහන්සේ**

**මෝසෙස්ට කථා කොට හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි වූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක: මට මෙහෙකරන පිණිස මාගේ සෙනඟ යන්නට හරින්න".**

මෙහෙකිරීම නම් නමස්කාර කිරීමයි. දෙවියන්වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව මුදා ගැනීමේ එකම අරමුණ ඔවුන් උන්වහන්සේට නමස්කාර කිරීමට ඉඩ දීමයි. දෙවියන්වහන්සේ සොයනුයේ සැබෑ කමින් නමස්කාර කරන්නන්ය. "**සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමින්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය. දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාර කරන්නන් වන පිණිස එබඳු වූවන් සොයන සේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමින්ද නමස්කාර කළ යුතුය" (යොහාන් 4:23-24).** ඔබත් මෙලෙස සැබෑ ඇදහිල්ලෙන් යුතුව දෙවියන්වහන්සේට නමස්කාර කරමින් උන්වහන්සේව ප්‍රසන්න කරනවාද?



ඇදහිලිවන්තයන් ලෙස තනි තනිව පුද්ගලිකව උන්වහන්සේට නමස්කාර කිරීමේ වැදගත්කම ඔබ සිතා බලා තිබේද? දාවිත් දෙවියන්වහන්සේට නමස්කාර කිරීමට ඔහුට ලද අවස්ථාව ගැන මෙසේ පවසා තිබෙනවා. "**ඔබගේ නාමය මාගේ සහෝදරයන්ට ප්‍රකාශ කරන්නෙමි. සභා මධ්‍යයෙහි ඔබට ප්‍රසංසා කරන්නෙමි" (ගීතාවලිය 22:22). "මහත් සභාවේදී මාගේ ප්‍රසංසාව පැමිණෙන්නේ ඔබ කෙරෙන්ය. උන්වහන්සේට භය වන්නන් ඉදිරියේ මාගේ භාර ඉෂ්ඨ කරන්නෙමි" (ගීතාවලිය 22:25).** මෙලෙස සෑම ඉරු දිනකම උන්වහන්සේගේ ශුද්ධ දරුවන් මධ්‍යයේ අපගේ නමස්කාරය හා ප්‍රශංසාව පුද කිරීමට ලැබීම කෙතරම් භාග්‍යයක්ද? ඇයි අප සභාව මධ්‍යයෙහි දෙවියන්වහන්සේට ප්‍රසංශා කිරීමට අවශ්‍ය වන්නේ?

**1 අපි ප්‍රශංසා කරන විට උන්වහන්සේ අපට සමීපව සිටින නිසා.** ද්විතිය කථාව 4:7 - "අපගේ දෙවි වූ ස්වාමින්වහන්සේට අප යාච්ඤා කරන සියලු ප්‍රස්ථාවයන්හිදීම උන්වහන්සේ අපට ළංව සිටින්නාකාමෙන් වෙන කොයි ජාතියකට දෙවි කෙනෙක් ළංව සිටින්නේද?"

**2. අපි නමස්කාර කරන විට සුවිශේෂී සෙනඟක්ව සිටිනවා.** ද්විතිය කථාව 7:6 - "මක්නිසාද නුඹ නුඹේ දෙවියන්වහන්සේට ශුද්ධ සෙනඟක්ය". සෑම ඉරු දිනකම සභාවේ සහභාගීත්වය මෙයින් පැහැදිලි කරනවා.

**3. උන්වහන්සේ අපව උන්වහන්සේගේ ම උරුමයක් ලෙස තෝරාගෙන සිටින නිසා**. ගීතාවලිය 33:12 - "ස්වකීය දෙවියන්වහන්සේ කොට ස්වාමින්වහන්සේ ඇතුව සිටින ජාතියද උන්වහන්සේ විසින් ස්වකීය උරුමය කොට තෝරාගත් සෙනඟද ආශිර්වාද ලද්දෝය".

**4. උන්වහන්සේ සියලු නපුරෙන් අපව මුදන නිසා.** දානියෙල් 6:16 - "..... නුඹ නොකඩවම සේවය කරන නුඹේ දෙවියන්වහන්සේ නුඹ ගළවන සේක්වායි කීවේය".

**5. නමස්කාරයේ සුවඳ දෙවියන් වහන්සේ වෙතට නැඟ යන නිසා.** එපීස 5:2 - "ක්‍රිස්තුස්වහන්සේ

නුඹලාට ප්‍රේම කොට මිහිරි සුවඳක් පිණිස දෙවියන්වහන්සේට පූජාවක්ද, යාගයක්ද කොට අප වෙනුවට තමන්ම පාවාදුන්නාක් මෙන්ම නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා".

ප්‍රේමවන්ත සහෝදර සහෝදරිය අපගේ ජීවිතයේ ප්‍රධානතම අරමුණ විය යුත්තේ අපගේ මැවුම්කාර දෙවියන්වහන්සේට නමස්කාර කිරීමයි. මක්නිසාද එවන් භාග්‍යයක් හිමිකර දීමට තරම් උන්වහන්සේ ඔබටත් මටත් ප්‍රේම කොට අපව තෝරාගත් සේක. උන්වහන්සේට සදාකාලයටම අයිති වූ අපි අපගේ ජීවිත වල පරණ දේ පහකර දමා යක්ෂයාගේ ක්‍රියාවන් ඉවත දමමින් දෙවියන්වහන්සේගේ දරුවන්ව සිටිමු. **"එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුල සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය පරණ දේ පහව ගියේය. මෙන්න සියල්ලම අලුත් වී තිබේ" (2 කොරෙන්ති 5:17). "නුඹලා නුඹලාටම අයිති නැත. මක්නිසාද නුඹලා මිලේට ගනු ලැබුවහුය".... (1 කොරෙන්ති 6:20)** මෙලෙස අපට බොහෝ ප්‍රේම කරන උන්වහන්සේ අප වෙනුවෙන් තම පුත්‍රයාණන්ගේ ජීවිතය දුන් සේක.

අප වෙනුවෙන් තම සියලු දේ අත් හැරිය සේක. **".... උන්වහන්සේ ධනවත්ව සිටිය නමුත් උන්වහන්සේගේ දිළිඳුකම කරණකොට ගෙන නුඹලා ධනවත් වන පිණිස නුඹලා උදෙසා දිළිඳු වූ බව නුඹලා දන්නහුය" (2 කොරෙන්ති 8:9)** මෙවැනි පුදුමාකාර කොන්දේසි විරහිත ප්‍රේමයකින් ඔබට සියලු දේ දුන් ඔබේ දෙව්පියාණන්ට ඔබ දෙන්නේ මොනවාද? උන්වහන්සේ ඔබට දුන් හැකියාවන් දක්ෂතාවයන් මිළ මුදලින් හෝ ඕනෑම දෙයකින් නැවතත් උන්වහන්සේට දෙන්නට ඔබගේ සූදානම කොහොමද? අපට තිබෙන ඕනෑම දෙයක් වේවා එය අඩුවෙන් හෝ වැඩි වශයෙන් දෙවියන්වහන්සේගෙන් ලැබුවෙමුව. දෙවියන්වහන්සේ දන්නවා උන්වහන්සේ අපට කොපමණ දී තිබෙනවාද කියා. එසේනම් අපි දෙවියන්වහන්සේට දිය යුත්තේ සතුටු සිතිනි. **"කනගාටුවෙන්වත් ඕනෑම නිසාවත් නොව එක් එක්කෙනා තම තමාගේ සිතින් නියම කරගත් ලෙස දේවා මක්නිසාද සතුටු සිතින් දෙන්නාට උන්වහන්සේ ප්‍රේම කරන සේක".** මක්නිසාද උන්වහන්සේ ප්‍රසන්න වන්නේ ඇද නැත්තාගේ යාච්ඤාවටය.

**"දුෂ්ඨයන්ගේ පූජාව ස්වාමින්වහන්සේට පිළිකුලක්ය. එහෙත් ඇද නැත්තාගේ යාච්ඤාවට උන්වහන්සේ ප්‍රසන්නය". (හිතෝපදේශ 15:8)** එලෙසම අපි නොකඩවා යාච්ඤා කළ යුතුය. **" නොකඩවම යාච්ඤා කරපල්ලා සියල්ලේදී ස්තූති කරපල්ලා මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුල නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය" (1 තෙසලෝනික 5:18).**

ප්‍රේමවන්ත සහෝදර සහෝදරිය. ඔබටත් මටත් බොහෝසේ ප්‍රේම කරන දෙවියන්වහන්සේව ප්‍රසන්නවන ආකාරයට අපගේ ජීවිත හැඩගස්වා ගනිමු. දිනපතාම උන්වහන්සේගේ ප්‍රේමය අලුත් ආකාරයකින් හා වැඩි වැඩියෙන් අත් විඳිමු. අපගේ ස්වාමීවූ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවෙහිද උන්වහන්සේගේ දැනගැන්මෙහිද වර්ධනය වීමට උන්වහන්සේගේ බහුල අනුග්‍රහය ඔබ සමඟ වේවා. !

**- ෆීලික්ස් කාමෙල් සහෝදරයාගේ දේශනාවක් ඇසුරින් -**

# අපි කිතුණුවෝ කෙසේ හැසිරෙමුද?

වසර 6000ක පමණ ඉතිහාසයක් ඇති මිනිස් සංහතියේ කැපී පෙනෙන උතුම් ගතිගුණ සහිත මිනිසුන් රාශියක් තම පා සළකුණු මිහිපිට තබා ගොස් ඇත. එවන් අය ගැන සිහිපත් කරමින්, කථා කරමින්, උදව් කරමින් අපි පසුවෙමු. එහෙත් මිනිසා මැවූ දෙවියන්වහන්සේ ඔහුට දුන් උච්චතම අභියෝගය සාර්ථකව ඉටු කිරීමට මිනිසාට හැකිද? එම අභියෝගය කුමක්ද?

**"තමන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් නුඹලා කැඳවන දෙවියන්වහන්සේට ඔබින ලෙස නුඹලා හැසිරෙන හැටියට" (1 තෙසලෝනික 2:11)** දෙවියන්වහන්සේ හා සංසන්දනය කළ විට මිනිසා අනන්තවාරයක් සුළුය, දුර්වලය, දෙවියන්වහන්සේ අනන්තවාරයක් අපට වඩා පරිපූර්ණය, ශුද්ධය, සුචරිතය, පාපය තම ජීවිත වෙලාගත් මිනිසා, අසරණව, අශුද්ධව සිටී. **"සියල්ලෝ පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති" (රෝම 3:23).** මේ සෝචනීය තත්වයට ඇති එකම විසඳුම ලෙස තම පුත්‍ර යේසුස්වහන්සේගේ ජීවිත පූජාව නියම කළ දෙවියන්වහන්සේ කමාව දීමේ පදනම මත අපව යලි උන්වහන්සේට සමඟි කරගත් සේක. යේසුස්වහන්සේ අදහාගත් මිනිසා පව්කමාව ලැබූ පුද්ගලයෙකි. එතැනින් නොනැවතුණු දෙවියන්වහන්සේ තමන් ආත්මය අප තුලට එවා දේව දරුකමද අපට උරුම කර දී තිබේ. දෙවියන්වහන්සේගේ පරිපූර්ණභාවය හා අපේ අධික ඌණතාවය තවමත් එසේ පවතින නමුදු යේසුස්වහන්සේගේ ඇදහීමද, දේවආත්මයාණෝ අප තුල වාසය කිරීමද, කරණකොට ගෙන අපි යලිත් දෙවියන්වහන්සේට වැඩක් ඇති පුද්ගලයන් වීමට හැකියාව ලබා ඇත්තෙමු. මේ නිසා යේසුස්වහන්සේ අදහා ගත් සහ නොගත් අය යන ජන කොටස් 2 අතර ඇත්තේ විශාල පරතරයකි. උන්වහන්සේ අදහාගත් මිනිසුන් දැන් මේ පොළොවේ දෙවියන්වහන්සේ නියෝජනය කරන්නෝ වෙති ඔබත් එවන් අයෙකි. දැන් ඔබ ඉදිරිපිට ඇති වගකීම් වනුයේ මනා ලෙස දෙවියන්වහනසේව මේ පොළොවේ සෙසු ජනයා ඉදිරිපිට නියෝජනය කිරීමයි. " **දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරීම"** වශයෙන් 1 තෙසලෝනික 2:11 ලියා ඇත්තේ මේ ගැනයි. මතක තබාගන්න ! අපගේ **වරප්‍රසාදය** නම් දෙවියන්වහන්සේ දැන හඳුනාගෙන සිටීමයි. අපගේ **වගකීම** නම් උන්වහන්සේට ඔබින ලෙස හැසිරීමයි.

අප ළමා වියේදී කිහිප විට අසන්නට ලැබූ ඔවදනක් වනුයේ " දෙමව්පියන්ගේ ගෞරවය ආරක්ෂා වන විදිහට හැසිරෙන්න" යනුවෙනි. දැන් අපට භාර වී ඇත්තේ ඊට වඩා අනන්ත වාර ගණනක් අභියෝගාත්මක වගකීමකි. අතිශුද්ධ, අති පරිපූර්ණ සදාකාලික දෙවියන්වහන්සේට ඔබින ලෙස එනම් උන්වහන්සේගේ ගෞරවය රක්ෂාවන ලෙස හැසිරීමය. මෙය පුළුල් මාතෘකාවක් බව අලුතින් කීමට උවමනා නැත. මා හැසිරිය යුත්තේ කෙසේද? මෙන්න පිළිතුරු.

**01 "ජීවනයේ අලුත්කමින් හැසිරෙන්න" (රෝම 6:4).** අප ගැළවීම ලැබීමේදී මහා ප්‍රාතිහාරයක් අප තුලම සිදුවේ. ශුද්ධාත්මයාණෝ අප රැගෙන යේසුස්වහන්සේගේ මරණයට වැලලීමට හා නැවත මළවුන්ගෙන් නැගිටීමට සම්බන්ධ කරන සේක. රෝම 6:3-5. ශුද්ධ ලියවිලි කොටසේ අර්ථය එයයි. යේසුස්වහන්සේ අදහාගන්නා අයගේ

**14 පිටුව බලන්න**

# යෝධ වැඩක් කළ - යෝතාම් රජ



ගිඩියොන්ගේ පුත්‍රයන් සැත්තෑ දෙනා අතරින් එක් අයෙක් වූ යෝතාම්, විනිශ්චකාරයන්ගේ පොතෙහි 9 වෙනි පරිච්ඡේදයෙ" 5 - 57 අපට හමුවෙයි. ඒ එක් අයෙකි. යුදාගේ ගොත්‍රයේ මිනිසෙක් වූ යෝතාම්, තවත් අයෙකි. ඔහු පිළිබඳව **1 ලේකම් 2:47** අපි කියවමු. මේ යෝතාම් නම දරණ තිදෙනා ජීවත් වූ වකවානු එකිනෙකාට වෙනස් වේ. ඔවුන්ගේ ක්‍රියාකාරකම්ද විවිධය. යෝතාම් යන නමේ තේරුම **"යෙහෝවාඃ වහන්සේ පිරිපුන්ය"** යන්නය. අප මෙහිදී අධ්‍යයනය කරන යෝතාම් රජ යුදාහී රජවූ උස්සියාගේ පුත්‍රයාය. උස්සියා රජ කමෙහි හිටියදීම රෝගාතුර වූ විට ඔහුගේ පාලන තන්ත්‍රයේ මෙහෙයවීම කළේ මෙම යෝතාම්ය. පස් වසරක් මුළුල්ලේ යෝතාම් විසින් පිය රජුගේ පාලනයෙහි වැඩ බැලූ පාලකයා විය. එවිට ඔහුට වයස වූයේ 20 වසරක් පමණය. ඔහුගේ මවගේ නම **2 ලේකම් 27:1** අනුව යෙරුෂාය. ඇය ශාදොක්ගේ දුවණියකි.

## යෙසායාගේ දූතනය.

උස්සියා රජ නැසුන අවුරුද්ද අනාගතවක්තෘ යෙසායා දේව මෙහෙවරට කැඳවූ සීමාව වෙයි **(යෙසායා 6:1)**. මෙහිදී යුවරජකමේ සිටි යෝතාම් යුදාහී රජ ලෙස තෝරාගනු ලැබීය. ඒ වන විට පුරා පස් වසරක පළපුරුද්දක් ලැබ සිටි යෝතාම් රජකම තහවුරු වූ හැටියේම සිය දක්ෂ පාලනය සිව් දිගට විහිදවා හැරීමට සමත් විය.

ඇදහිලිවන්තයා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහාගත් පසුව ක්‍රමයෙන් ක්‍රිස්තු ස්වරූපයට මාරුවීම අරඹයි. ඔහු එක්වරම දේව වචනයෙහි එල දරන්නේ නැත. එසේම එකම ස්ථානයක නතරව සිටින්නේද නැත. **ගලාති 4 :19** පරිදි යේසුස්වහන්සේ ඇදහිලිවන්තයා තුල සම්පූර්ණත්වයට පැමිණවීම දේව කැමැත්තය. **"සම්පූර්ණව සිටපල්ලා"** යයි **(2කොරින්ති 7:1 , එපීස 10)** දේව වචනය දක්වයි. සම්පූර්ණත්වය කරා ක්‍රමයෙන් එළඹෙන විට විවිධාකාරයේ අත්දැකීම් අපගේ ජීවිත වලට ඇතුලත් වීමට ස්වාමින්වහන්සේ ඉඩ හරින සේක. ඒවා ගිනිමය පීඩා බඳු අම්හිරි අත්දැකීම් වන්නට බැරි නැත. **(1 පේත්‍රුස් 1:3-9 දක්වා පද)** එහෙත්, සියල්ල රජකමක් සඳහාය. අත්දැකීම් රහිත රජෙකුගේ පාලනය ගිලිහීයාම සීග්‍රවෙයි. පුහුණුවක්, ප්‍රායෝගි ක අත්දැකීමකුත් වර්ධනාත්මක ඕනෑම ඇදහිලිවන්තයෙකුට නුහුරු නොවේ. වඩාත් හොඳ රත්රන් නිකුත්වන්නේ වඩාත් උණු වුන කෝවයකින් බව අමතක නොකරමු. **පිලිප්පි 3:8** අනුව ස්වර්ගී ය නායකත්වයට පුරවැසි වූ ජනතාවක් ඊට ආත්මයෙන් හුරුකරවීම සඳහා ශාරීරික හෝ මාංශික තෘෂ්ණාවන්ගෙන් මුදාලනු ලැබීමේ දිව්‍ය සැලසුම් ක්‍රියාත්මක වන විට අසීරුතා හට ගැන්ම අස්වාභාවික නොවනු ඇත. යෝතාම්ද, මේ නීරස හා කටුක උමඟ හරහා ගියේය. දාවිත්, යෝසප්, ගිඩියොන් පමණක් නොව ස්වාමිවූ යේසුස්වහන්සේද, සියලු ප්‍රේරිතයන්ද, ප්‍රොපේතවරුන්ද, කටුක උමඟ හරහා ගිය අධ්‍යාත්මික ප්‍රතිශක්තියේ ආදර්ශයන්ය. එබඳු අත් දැකුම් රහිත බයිබලීය චරිත ඉතාමත්ම දුර්ලභය. ඉතින්, යෝතාම් මෙන් ඔබටත්

පුහුණුවේ, පරීක්ෂ වේ, සෝදිසි කිරීමේ, වර්ධනය කිරීමේ, රැඳීසිටීමේ, බලා සිටීමේ, ඉවසීමේ කාලයකට පැමිණිය හැකිය. රජකම! ස්ථාවර වූ පරිණත බුද්ධිමය සදාකල රජකමක් වෙනුවෙන් නොකොඳුරන්න. දේව කැමැත්ත සොයන්න දුර්මුඛ නොවන්න.

## ඕපෙල් තහවුරුව

රජ ගෙදර ප්‍රධානියා **(2 ලේකම් 26:21)** රජකමට පත්විය. එවිට ඔහුට විසිපස් වසරක් විය. මෙම කීර්තිමත් රජු එතැන් සිට 16 වසරක් මුළුල්ලේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ අඩිපාරේ යමින් උන්වහන්සේගේ ඇස් හමුවෙහි හරිව තිබුණු දේ කළේය. ඔහු කළ වරදක් ලෙස අප අධ්‍යයනය කරන්නේ යෝතාම් මාලිගයට ඇතුල් නොවූ බවය. ඔහුගේ පියා දේවමාලිග යට ගොස් කළ පාපය නිසා ඊට ලැබූ අනිටු විපාකය යෝතාම්ව මේ තත්වයට පත්කලා විය හැකිය. ක්‍රි. පූ. 724 දක්වා ඔහු රාජ්‍ය කළ බව ඇතැම් පොත්වල දැක්වේ.

සියොන් (යෙරුසෙලම) කන්දේ උතුරු කෙළවර හෙවත් දේව මාලිගය හා සියොන් කන්ද අතර වූ ස්ථානය " ඔපෙල්" නම් විය. රජු දේව ගෘහයේ ඉහළ දොරක් ඔපෙල් වූ හී පවුරේ වාසස්ථානය හා ආරක්ෂක මුර කුළුණුත් නංවා නගර නිර්මාණයෙහි දස්කම් පෑවේය. මෙම හේතුවෙන් ආරක්ෂාවත් අලංකාරයත් එකවිටම සිදුවූ බව පෙනේ. සත්‍යවාදී ඇදහිලිවන්තයා සභාවේ ආත්මික ප්‍රතිපත්තීන් සපුරා ජීවිතයේ ක්‍රියාවට නැගීමෙන් සභාව ආරක්ෂා කිරීමට උනන්දු වන අතරම තමාගේ ආත්මික ජීවිතයද එමගින් හැඩ වැඩ කර ගනී.

යුදාහී කඳුරට ප්‍රදේශවල **(යොෂුවා 15 බලන්න)** චමත්කාරය දනවන නව නගරද, කැලෑ - මුකලාන පෙදෙස් ආරක්ෂා කොට බලකොටුත් මුර කොටුත් තනා සතුරු උපද්‍රව ගැන නිතර අවදියෙන් සිට, ස්වකීය ජනතාවගේ සුරක්ෂිතභාවය තහවුරුකිරීම යෝතාම්ගේ යෝධ මෙහෙවරට අයත් විය. සභාව ආරක්ෂා කිරීමෙහි රිසිවන ඇදහිලිවන්තයා තමාගේම ආත්මය නිරතුරු රැකබලා ගනී. යෝතාම්ද, යුදා රට රැකීමට දේව කරුණාව සෙවූ බව ශු. බයිබලය කරුණු දක්වයි **(2 ලේකම් 27:6).**

## සුවඳ දුම් පිදීමේ එල

යෝතාම් අම්මොන් පුත්‍රයන්ගේ රජුට විරුද්ධ යුද්ධ කොට ජය ගෙන පුරා තුන් වසරක් කප්පම් ගෙවා ගත් අයුරු **2 ලේකම් 27:5** දැක්වේ. යෝතාම්ගේ මරණය ස්වභාවික එකක් වූ බව පෙනේ. ඔහු යෙරුසෙලමේ රජුන්ට අයත් කොටසෙහි තැම්පත් කරන ලදී. යෝතාම්ගේ කාලයේ රජ වූ රෙශින්ද, පෙකා නම් අයද යුදාට විරුද්ධව සටන් වැදුන බව **2 රාජාවලිය 15 : 37** පෙන්වයි. එයට හේතු වූයේ යුදාවරු මිත්‍යා විශ්වාසය අතහැර නොදමා උස් තැන්වල බොරු දෙවි වරුන්ට යාග පිදීමත්, සුවඳ දුම් දැවීමත්ය. යෝතාම්ගේ සාරවත් රජකමේ අවසානයේදී ඔහුගේ පුත්‍ර ආහස් රජකමින් පිදුම් ලැබීය.

**- ප්‍රන්සිස් විජයසිංහ -**



**11 වැනි පිටුවෙන් අපි කිතුණුවෝ ......**

ජීවිත අලුත් විපර්යාසයකට භාජනය වනුයේ දෙවියන්වහන්සේ සිදු කරන මේ ආත්මික ශෛල්‍යකර්මය හේතුවෙනි. මෙය අලුත් ඉපදීමයි. ජීවිතයේ අලුත් පිටුවක් පෙරලීමක් නොව අලුත් පොතක් බවටම පත්වීමකි. මෙය හුදෙක් අපගේ දැඩි තීරණ නිසා හෝ නොපසුබට උත්සාහය නිසා සිදුවන වෙනසක් නොවේ. මෙය දෙවියන්වහන්සේගේ ආත්මික ක්‍රියාවක් නිසා සිදුවන්නකි. යේසුස්වහන්සේ තම ගැළවුම්කරුවාණන් ලෙස පිළිගෙන අදහා ගන්නාට මෙමගින් අලුත් ජීවිතයක් ගත කිරීමට තම ජීවිතය තුළම හැකියාව සලසා දෙනු ලබයි. කොටින්ම කියතොත් අප කථාකරන මේ වෙනස ඇති කරන්නේ තමා නොව දෙවියන්වහන්සේය.

**"යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය" (2 කොරින්ති 5:17)** "ඔහු උත්සාහයෙන් ටික ටික අලුත් මැවිල්ලක් බවට පත් වෙනවා" නොව "ඔහු අලුත් මැවිල්ලකි" දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරීමෙහිලා ප්‍රථම කරුණ නම් ජීවනයේ අලුත්කමෙන් හැසිරීමයි. ඉතින් කොහොමද ඔබේ ජීවිතය. ජීවනයේ අලුත්කමෙන් හැසිරෙන පුද්ගලයෙකු හැටියට ඔබට ඔබවම හඳුනාගත හැකිද? මෙය අති වැදගත් ප්‍රශ්ණයයි. පිළිතුර. "ඔව්" නම් ඔබ යන්නේ හරි පාරේ. ඉස්සර කළ විදිහට පව් කරමින් ජීවත් වීමට දැන් ඔබට කැමැත්තක් නැත. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් දැන් ඔබ තුළ වැඩ සිටින සේක. සියල්ල අලුත් කරන්නේ උන්වහන්සේ ඔබව යේසුස්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීමට බද්ධ කල නිසාය.

**02. "ඇදහිල්ලෙන් හැසිරීම" (2 කොරින්ති 5:7)** කිතුණුවකු හඳුන්වන සංඥා නාමය "ඇදහිලිවන්තයා" නම් වේ. ඔහු අදහන කෙනෙකි. ඔහු අදහන්නේ කුමක්ද? ශුද්ධ බයිබලයේ සඳහන් සෑම දේ සත්‍ය බව ඔහු මුළු හදින් අදහයි. එය ඔහුගේ ජීවිතයේ පදනම වේ. ඉහත පදයේ සඳහන් ඇදහීමෙන් හැසිරීම ඇදහිලිවන්ත ජීවිතයේ එක් ප්‍රමුඛ ලක්ෂණයක් පිළිඹිබු කරයි. 2 කොරින්ති 5 වැනි පරිච්ඡේදයේ පාවුල්තුමා සාකච්ඡාවට භාජනය කරන්නේ ඇදහිලිවන්ත අපට මරණින් මතු සිදුවන දෙය ගැනයි. **"කූඩාරමක් වූ අපේ භූමික ගෙය කඩා වැටුනත් දෙවියන්වහන්සේගෙන් වූ ගොඩනැගිල්ලක්වන අතින් නොසෑදුවාවූ සදාකාලික වූ ගෘහයක් ස්වර්ගවල අපට ඇති බව දනිමුව" (2 කොරින්ති 5:1).** මෙන්න මේ බලාපොරොත්තුව ගැන දැනගෙන සිතේ සහතිකයක් ඇතුව ජීවත් වීම නම් "ඇදහිල්ලෙන් හැසිරීම" ලෙස ඔහු 7 වැනි පදයේ සඳහන් කරන්නේ මරණින් මතු කොහෙද යන්නේ? මොකද වෙන්නෙ? කියා දන්නාවූ පුද්ගලයා ඊට අනුකූලව තම ජීවිතයේ තීරණ තීන්දු ගන්නවා නිසැකයි. මරණින් මතු ඔබ ස්වර්ගයට යන බව සහතිකද ඒ සහතිකය අපට ලැබෙන්නේ දේව වචනයෙන්මයි. ඒ සහතිකය අපට තිබෙන නිසා මේ වර්ථමාන ජීවිතයේ අවදානම් කලාප වලට අවතීරණ වීමට අප බිය වන්නේද නැත. "හැමෝම ස්වර්ග යට යන්න කැමතියි. හැබැයි කවුරුවත් මැරෙන්න කැමති නෑ" යන කියමන අප ගැන නොවෙයි. අප හැසිරෙන්න ඕන ඕනෑම වේලාවක ස්වර්ගයට යන්න කැමති අය වගෙයි. අපගේ සියලු තෝරා ගැනීම ස්වර්ගයට යන්න ඉන්නාවූ මිනිසුන්ගේ ආකාරයට විය යුතුයි. මේ තමා හොඳ හැසිරීම. මේ තමා දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරීම.

- දෙවැනි කොටස මීළඟ කළාපයෙන්-

**- නෙවිල් ජයසුන්දර -**

# ඇත්ත කථාව



දෙසැම්බරය ළං වනවිට බොහෝ කිතුණුවන් නත්තල සැමරීමට සූදානම් වෙති. යේසුස්වහන්සේගේ උපත ගැන කියවෙන බොහෝ ගීතිකා, නාට්‍යය, වීදි නාට්‍යය, අපට දකින්නට හා අසන්නට ලැබේ. නත්තල බොහෝ ආකර්ෂණීය උත්සවයක් ලෙස ලෝකයෝ දකිති. සමහර කිතුණුවන් අතර අඩු වැඩි වශයෙන් සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර මිශ්‍රවද, සමහර කිතුණුවන් අතර ප්‍රිය සම්භාශනයන්ට තෝතැන්නක් ලෙසද තවත් කිතුණුවන් අතර හොඳ වැඩ, බෙදා හදා ගැනීම් හා උදව් කිරීමේ කාලයක් ලෙසද නත්තල් කාලය ප්‍රසිද්ධය. තරාතිරම් හා සමාජ මට්ටම අනුවද නත්තල සැමරීම වෙනස් වෙයි. නුමුත් මේ සැවොම සමරන්නට බලාපොරොත්තුවන්නේ කිතු උපතයි. ලෝකය පුරා අන්‍යාගමිකයන් පවා හොඳින් දන්නා බෙත්ලෙහෙමේ ගව මඩුවක ඉපදුන යේසුස්වහන්සේගේ උපතේ කථාව ඔබ දන්නවාද?

යේසුස්වහන්සේගේ උපතේ කථාව දෙයාකාරව තිබේ. එනම් සියලු ලෝකයන් දන්නා වර්තමාන ජන වහරයේ පවතින පරම්පරාවෙන් පරම්පරාවට අඩු වැඩි වශයෙන් වෙනස්කම් වලට භාජනය වන කථාව හා ශු. බයිබලයේ කථාවත්ය.

මේ නත්තල් කාලයේ යේසුස්වහන්සේගේ කථාව නිවැරදි ලෙස දැනගැනීම සඳහා අධ්‍යනයක යෙදෙමු.

- යේසුස්වහන්සේගේ පියා යෝසෙප් හෙවත් ජුසේතුමා බව ඔබ අසා ඇති. එහෙත් ශුද්ධ බයිබලයට අනුව යේසුස්වහන්සේට භූමික පියෙක් නොමැත.

ඒසඳහා බයිබලීය සාක්ෂි - **"මරියා යෝසෙප්ට විවාහ බස් දී සිටියදී ඔවුන් එක් වන්නට පළමුවෙන් ශුද්ධාත්මයාණන් කරණ කොට ගෙන ඈ ගර්භණී වූ බව දැනගන්නා ලදී" (මතෙව් 1:18).**

"යෝසෙප් නම් මනුෂයෙකුට විවාහබස් දී සිටි කන්‍යාවකු වෙතට දෙවියන්වහන්සේ වෙතින් ගාබ්‍රියෙල් නම් දූතයා යවන ලද්දේය....." "බලව නුඹ ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. උන්වහන්සේ උතුම්ව දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන්නේය....." "එවිට මරියා දේවදූතයාට කථාකොට මා පුරුෂයෙකු නැඳින සිටින බැවින් මේක වෙන්නේ කෙසේදැයි කීවාය....." "ශුද්ධාත්මයාණන් නුඹ කෙරෙහි පැමිණෙන සේක, මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසා ගන්නේය. **ඒ නිසා උපදින්නට සිටින තැනැත්තේ ශුද්ධය දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක" (ලූක් 1:26-35).**

- යේසුස්වහන්සේ බෙත්ලෙහෙමේ ගව මඩුවක ඉපදුනු බව ජනවහරේ පැවතුනත්, යේසුස්වහන්සේ ඉපදුනේ

ගෙදරක, ගෙදර හොඳ ඉඩක් නොමැති බැවින් මරියා බිළිඳු යේසුව ගවයන් කන ඔරුවක තැබුවාය.

"තවද ඒ දවස් වලදී මුළු ලෝකයාගේ ලේඛණයක් සෑදීමට (ජන සංගණනයක් පැවැත්වීමට) කායිසර් අගෝස්තුස් කෙරෙන් නියෝගයක් නිකුත්ව ගියේය. සියල්ලෝ ලිය වෙන්නට තම තමන්ගේ නුවර වලට ගියෝය. යෝසෙප්ද දාවිත්ගේ පෙළපතටත් වංශයටත් අයිති බැවින්, තමාට විවාහ බස් දුන් ගර්භණීව සිටි මරියා සමග ලියවෙන්නට, ගලීලයෙහි වූ නාසරෙත් නුවරින් පිටත්ව යුදයේ බෙත්ලෙහෙම් නම් දාවිත්ගේ නුවරට ගියේය. තවද ඔවුන් එහි සිටියදී ඇගේ වදන කාලය සම්පූර්ණ විය. **<u>ඈ කුළුදුල් පුත්‍රයා වදා රෙදිවලින් ඔතා නවාතැන් ගෙයි ඔවුන්ට ඉඩ නොතිබූ බැවින්</u>** ගවයන් කන ඔරුවක තැබුවාය" (ලූක් 2:1-7).

● යේසුස්වහන්සේ ඉපදුන විට වල්ගා තරුවක් අහසෙහි දිස් වුණා. එම තාරකාව රජතුන් කට්ටුවට මඟපෙන්නුවා යේසුස්වහන්සේව සොයාගන්නට, නමුත් බයිබලයේ සඳහන් වන්නේ, යේසුස්වහන්සේ ඉපදුන විට උන්වහන්සේගේ තාරකාව ශාස්ත්‍රවන්තයන් දැක, උන්වහන්සේට නමස්කාර කරන්නට පැමිණි බවයි. ".....බෙත්ලෙහෙමේ යේසුස්වහන්සේ උපන් කල, පූර්ව දිශාවෙන් ශාස්ත්‍රවන්තයෝ යෙරුසෙලමට ඇවිත් යුදෙව්වරුන්ට රජව උපන් තැනැන්වහන්සේ කොහිද? මක්නිසාද අපි **<u>උන්වහන්සේගේ තාරකාව</u>** පූර්ව දිශාවෙහි දැක, උන්වහන්සේට නමස්කාර කරන පිණිස ආවෙමු යැයි කීවෝය." (මතෙව් 2:1-2) (මතෙව් 2:7 ට අනුව කොයි කාලයේදී දුටුවේදැයි ඇසීම සහ නැවතත් තාරකාව දැක ප්‍රීති වීම.)

● යේසුස්වහන්සේ බලන්නට පැමිණියේ රජතුන් කට්ටුවක් බව පිළිගැනුනත් බයිබලයේ සඳහන්වන්නේ **<u>ශාස්ත්‍රවන්තයන්</u>** පැමිණිබවයි. නුමුත් කොපමණ දෙනෙක් පැමිණ සිටියාදැයි ගණනක් සඳහන්ව නැත. (මතෙව් 2:1-2).


● ඔවුන් යේසුස්වහන්සේ බලන්නට ගවමඩුවට ගිය බව, නමුත් ශුද්ධ බයිබලයට අනුව ශාස්ත්‍රවන්තයන් යේසුස්වහන්සේට නමස්කාර කළේ ගෙදරකදීය.

"ඔවුහු **<u>ගෙටවැද ළදරුවා</u>** ස්වකීය මව වූ මරියා සමග සිටිනවා දැක..." (මතෙව් 2:11).

● ඔවුන් යේසුස්වහන්සේට සහ මව වූ මරියා යන දෙදෙනාටම නමස්කාර කළා. නුමුත් බයිබලයේ සඳහන් වන්නේ ඔවුන් නමස්කාර කළේ යේසුස්වහන්සේට පමණක් බවයි. ".... ළදරුවා ස්වකීය මව වූ මරියා සමග සිටිනවා දැක බිම වැටී **<u>උන්වහන්සේට</u>** නමස්කාර කොට..... (මතෙව් 2:11)."

ශුද්ධ බයිබලයේ අලුත් ගිවිසුමේ ශුභාරංචි පොත් කියවීමෙන් තවදුරටත් මේ සත්‍යය තහවුරු කරගන්න.

**- ශෂිලා රාජ් -**



# අස්වැන්න නෙළමු

**"ස්වර්ගයෙහිද පොළවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම කරපල්ලා මා විසින් නුඹලාට අණ කල සියල්ල පවත්වන්නට ඔවුන්ට උගන්වාපල්ලා මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හීම නුඹලා සමඟ සිටිමි" (මතෙව් 28:18-20).**

අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහා ආශිර්වාදය හඬ අප හැමදෙනාගේම දෙසවන් තුල නිරතුරුවම පිළිරැව් දෙත්වා! යමෙකු යේසුස්වහන්සේ වෙත යොමු කිරීමෙන් ලබන සතුට තරම් මහත් ප්‍රීතියක් ඇදහිලිවන්තයෙකුට තවත්නම් නැතැයි මම සිතමි. දෙවියන්වහන්සේගේ බලය හා වැඩ සටහන සහිතව අප ලෝකයට ගොස් අස්වැන්න නෙලීම කළ යුතුය. ලෝකයා ගෝලයන් කිරීමටත්, ඔවුන්ට දේව වචනය උගන්වන්නටත් අපට උන්වහන්සේ වගකීම භාර දී තිබේ. එය උන්වහන්සේගේ මේ ලෝකයා සම්බන්ධව ක්‍රියාත්මක කරන වැඩසටහනයි. එමෙන්ම යුගයේ අවසානය දක්වා අප සමඟ සිටින බවටද, උන්වහන්සේ පොරොන්දු වී ඇත. අපට මෙම සේවය කිරීමට ඇත්තේ උන්වහන්සේ සමඟයි.

අද දවසේ අප සෑම කෙනෙකුටම අයත් ශ්‍රේෂ්ඨතම කාර්ය භාර්ය වන්නේ මුළු ලෝකය වෙත ශුභාරංචිය ගෙන යාමයි. එය අප සෑම කෙනෙකුටම කළ හැකි දෙයක් බවයි. මාගේ විශ්වාසය. එය අපට කළ නොහැකි දෙයක්නම් උන්වහන්සේ එය අපට භාරදෙන්නේ නැත. ඔබත් මාත් ජීවත්වන්නේ සහා යුගයේ කෙළවරය. එනම් තීරණාත්මක කාල වකවානුවකය. අද දවසේ ආත්ම දිනා ගැනීම මහත් උනන්දුවකින් ලෝකය පුරා සිදුවන අතර අපත් එම මෙහෙයට කර දෙමු.

## සාර්ථක ආත්ම දිනන්නෙකු සතු ජීවිතය.

**01. වෙනස් වූ ජීවිතය - නැවත ඉපදීම ලබා තිබීම.**

එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුල සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය, පරණ දේ පහව ගියේය මෙන්න සියල්ල අලුත් වී තිබේ - **2 කොරින්ති 5:17.**

**02. පිරිසිදු ජීවිතයක් - පාපයට ද්වේශ කිරීම.**

එබැවින් යමෙක් මේවා රක්ෂා කර තමාවම පවිත්‍ර කර ගනී නම් ඔහු පිරිසිදු කරණු ලැබුවාවූ, ස්වාමියාගේ පාවිච්චියට සුදුසු සියලු යහපත් වැඩ වලට සූදානම්වූ, ගෞරවය පිණිස වූ භාජනයක් වන්නේය **(2 තිමෝති 2:21).**

**03. යාච්ඤාවෙන් පූර්ණ ජීවිතයක් - දෙවියන්වහන්සේගේ හැකියාව විශ්වාස කිරීම**

මට යාච්ඤා කර පන්න. එවිට මම නුඹට උත්තර දී නුඹ නොදන්නාවූ මහත්වූ අමාරු දේ නුඹට පෙන්වන්නෙමි **(යෙරමියා 33:3).**

**04. විනාශ වන ජනතාව පිළිබඳ කැක්කුමක් සහිත ජීවිතය - දර්ශනයක් තිබීම.**

මට බලවත් ශෝකයද, හෘදයෙහි නිරන්තර වේදනාවද, තිබේ යයි බොරු නොකියා ක්‍රිස්තුස්වහන්සේ තුල සැබෑව කියමි. ඒබවට ශුද්ධාත්මයාණන්වහන්සේ තුල මාගේ හෘද සාක්ෂිය මා එක්ව සාක්ෂි දරයි. මනුෂ්‍යාකාරයෙන් මාගේ නෑයා වූ මාගේ සහෝදරයන් උදෙසා ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් වී ශාප ලද්දෙක් වෙන්නට පුළුවන්නම් ඊටත් කැමති වෙමි (රෝම 9:1-3).

**05. සානුකම්පිත ජීවිතයක් - විනාශවන ජනයා කෙරෙහි ඇති අනුකම්පාව.**

උන්වහන්සේ සමූහයක් දැක ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් ලෙස හිරිහැර විඳිමින් විසිර ගොස් සිටිය බැවින් ඔවුන් කෙරෙහි අනුකම්පා කළ සේක **(මතෙව් 9:36).**

**06. නම්‍යශීලී ජීවිතයක් - නිහතමානීභාවය.**

දුර්වලයන් දිනාගන්න පිණිස දුර්වලයන්ට දුර්වලයෙක් වුනෙමි. සියලු ආකාරයෙන්ම සමහරෙකු ගලවන පිණිස මම සියල්ලන්ට සියල්ල වුනෙමි **(1 කොරින්ති 9:22).**

**07. අධිෂ්ඨානශීලී ජීවිතයක් - ප්‍රතිඵල හෝ ප්‍රතිචාර මත රඳා නොපැවතීම.**

මක්නිසාද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේ කුරුසියේ ඇණ ගසනු ලැබූබවත් මිස වෙන කිසිවක් නුඹලා අතරේ නොදැන සිටින්නට නියම කර ගතිමි (1 කොරින්ති 2:2). එකක් කරමි පස්සෙන් තිබෙන දේ මතක නැති කොට ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමි (පිලිප්පි 3:13).

**08. සන්නද්ධ ජීවිතයක් - දේව වචනය හැකියාවන් හා සමාජීය දැනුම වර්ධනය කර ගැනීම.**

ඔබගේ වචන එළිදරව් වීමෙන් ආලෝකය ලැබේ එයින් නුවණ නැත්තන්ට තේරුම් ලැබේ **(ගීතාවලිය 119:130).**

**09. යටත් කරන ලද ජීවිතයක් - ශරීරය දමනය කරගැනීම.**

එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ **(රෝම 12:1).**
මක්නිසාද මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා - **(පිලිප්පි 1:21)**

**10. ක්‍රිස්තුස්වහන්සේ කේන්ද්‍ර කරගත් ජීවිතය - යේසුස්වහන්සේ සමඟ හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.**

මා තුල පැවතියල්ලා - මමත් නුඹලා තුල පවතින්නෙමි. අත්ත මිදිවැලෙහි නොපවතීනම් නියම ඵල දරන්ට බැරුවාක් මෙන් නුඹලා මා තුලෙහි නොපවතී නම් ඵල දරන්ට නුඹලාට බැරිය **(යොහාන් 15:4).**

**11 ආත්ම පූර්ණ ජීවිතයක් - ශුද්ධාත්මයාණන්ගේ උපකාර මතම යැපීම.**

නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා .... පොළොවේ සීමාව දක්වා මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය **(ක්‍රියා 1:18)**. බලයෙන්වත් ශක්තියෙන්වත් නොව මාගේ ආත්මයෙන් යැයි සේනාවල ස්වාමීන්වහන්සේ කියන සේක **(සෙකරියා 4:6).**

**12. වගකියන ජීවිතය - වගකීම් සහිතභාවය හා ගණන් දීම.**

ඒහෙයින් අප එක් එක්කෙනා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන් දෙනවා ඇත **(රෝම 14:12).**
මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ සේවායන් මෙන්ද, දෙවියන්වහන්සේගේ ......... ගබඩාකාරයන් මෙන්ද ගණන් ගනිත්වා **(1 කොරින්ති 13:5).**
ඔවුහු ආ කල සභාව රැස් කරවා දෙවියන්වහන්සේ තමුන් ලවා කෙරවූ සියල්ලද, අන්‍යජාතීන්ටද උන්වහන්සේ ඇදහිල්ලේ දොරක් ඇර දුන් බවද, දැන්වුවෝය **(ක්‍රියා 14:27).**

**- ගුරු හරු -**

# දෙවියන්වහන්සේ අප තෝරා ගන්නා ලද්දේ කුමක් උදෙසාද?



**එපීස 1:4** අනුව දෙවියන් වහන්සේ අදහා ගන්නා පිණිස දෙවියන්වහන්සේ විසින්ම අප තෝරාගෙන ඇති බව බයිබලයේ ප්‍රකාශ කරයි. ඊශ්‍රායෙල් ජනතාව තෝරාගත් ලෙසම වර්ථමාන අන්‍ය ජාතීන් වන අප උන්වහන්සේගේ දරුවන් වන පිණිස තෝරාගෙන ඇත. එය අපගේ තීරණයක් නොවන බව පැහැදිලිය. එසේනම් ඇයි අප තෝරා ගනු ලැබුවේ කුමන අභිප්‍රායක් උදෙසාද?

## 01 දෙවියන්වහන්සේගේ දරුවන් වීමට - ගැළවීම ලැබීමට.

යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක. ඔවුන් ලෙයින්වත් මාංශයේ කැමැත්තෙන්වත් මනුෂ්‍යයාගේ කැමැත්තෙන්වත් නොව දෙවියන් වහන්සේගෙන් උපන්නෝය **(යොහාන් 1:12-13).**

## 02 දෙවියන්වහන්සේගේ පුත්‍රයන් වීමට - පුත්‍රකම ලැබීමට.

අනාගතයේදී සිදුවීමට ඇති දෙයකි. දෙවියන්වහන්සේ විසින් අප උන්වහන්සේගේ පුත්‍රයන් ලෙස මුළු මැවිල්ල ඉදිරියෙහි ප්‍රසිද්ධියේ පිළිගැනීමට නියමිතය. **(රෝම 8:19 / හෙබ්‍රෙව් 2:10)** තමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණ කොට ගෙන පුත්‍රයන් වීමට අප පෙර නියම කළ සේක **(එපීස 1:6).**

## 03. දෙවියන්වහන්සේගෙන් උරුම යක් ලබා ගැනීම

- උරුමක්කාරයන්වීමට තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල ප්‍රසිද්ධ කරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට අපි පෙර නියම කරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුල උරුමයක් වී සිටිමු **(එපීස 1:11) (1 පේතෘස් 1:4).**

## 04. දෙවියන්වහන්සේට සේවය කිරීමට - හවුල් සේවකයන් වීමට.

මක්නිසාද අපි දෙවියන් වහන්සේගේ හවුල් වැඩ කරන්නෝය. නුඹලා දෙවියන්වහන්සේගේ කෙත ය. දෙවියන්වහන්සේගේ ගොඩ නැගිල්ලය. **(1 කොරින්ති 3:9)** තවද අපි දෙවියන්වහන්සේගේ හවුල් වැඩ කරන්නෝය. **(2 කොරින්ති 6:1)**

## 05 දෙවියන්වහන්සේගේ පූජක සේවයට - පූජකයන් වීමට.

අලුත් ගිවිසුමේ සභාව තුල සියලු ඇදහිලිවන්තයන්ගේ පොදු පූජක ත්වය පිළිගත යුතුය.

නුඹලා යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේට ප්‍රසන්න ආත්මික පූජා ඔප්පු කරන පිණිස ශුද්ධ ජන සමූහයක් වීමට ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් මෙන් ගොඩ නගනු ලබන්නහුය **(1 පේත්‍රැස් 2:5).**

"අන්ධකාරයෙන් තමන්ගේ විශ්මපත් ආලෝකයට නුඹලා කැඳවා ගත් තැනැන්වහන්සේගේ උත්කෘෂ්ඨතාවයන් දක්වන පිණිස නුඹලා වනාහී තෝරාගත් වංශයක්ද, රාජකීය පූජකයෝද, ශුද්ධවූ ජාතියක්ද, දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද, වන්නහුය" **(1 පේත්‍රැස් 2:9).** අපව රාජ්‍යයෙන්ද, තමන් පිය වූ දෙවියන්වහන්සේගේ පූජකයන්ද කළා වූ තැනැන්වහන්සේට ගෞරවයද, පරාක්‍රමයද, සදාකාලයටම වේවා **(එළිදරව් 1:6).**

## 06. ක්‍රිස්තුස්වහන්සේ සමඟ රජකම් කිරීමට - අනාගත පාලකයන් වීමට.

- අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමුව **(2 තිමෝති 2:12).**

- ඔවුහු ජීවත්ව ක්‍රිස්තුස්වහන්සේ සමඟ අවුරුදු දහසක් රජකම් කලෝය **(එළිදරව් 20:4-6).**

- එහි රාත්‍රිය තවත් නොවන්නේය පහන් ආලෝකයවත් සූර්යා ලෝකයවත් ඔවුන්ට ඕනෑ නැත. මක්නිසාද ස්වාමිවූ දෙවියන්වහන්සේ ඔවුන්ට ආලෝකය දෙන සේක. ඔවුහු සදාකාලයටම රජකම් කරන්නෝය **(එළිදරව් 22:5).**

අප තෝරාගත් දෙවියන් වහන්සේට තවත් බොහෝ ආශාවන් අප පිළිබඳව ඇත. ඔබත් දේව වචනයෙන් ඒවා සොයා දැනගන්න. දිනපතා බයිබලය කියවන්න හැකි සෑම උත්සාහයක්ම දරන්න.

**- ජීවන හඬ -**

# සම්පූර්ණ කවුද?



ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුමේ දක්නට ලැබෙන ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිතය තුලින් දැකගත හැකි පාඩමක් වන්නේ, ඉශ්‍රායෙල් ජනතාව එනම් දෙවියන්වහන්සේගේ ජනතාව ඔවුන්ගේ ජීවිත කාලය තුල කිසිසේත් සම්පූර්ණත්වයකට නොපැමිණි බවයි. ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේ ඉදිරියෙහි සම්පූර්ණව නොසිටි බවට බෙහෝ උදාහරණ බයිබලයෙන් අපට දැකගත හැක. මෙය අපට ඉතා හොඳින් පිළිඹිබු වන්නේ කාන්තාර ගමනේදී ඔවුන් ගත කළ කාල පරිච්ඡේදය තුලිනි. ඔවුන් එම කාන්තාර ගමන තුලදී දෙවියන්වහන්සේව දුකට, විඩාවට පත්කළ අතර ඔවුන්ගේ කෙඳිරීමද නොඅාඩු විය. ඔවුන්ගේ ජීවිත කිසි කලකත් තෘප්තිමත්භාවයට හෝ සම්පූර්ණත්වයකට පැමිණේයේ නැත. උදා: **(නික්මයාම 15:24, 16:8, 17:3, ගණන් කථාව 14:9-27).**

අද අපගේ ජීවිතද එසේම විය හැක. අපිද තෘප්තියට නොපැමිණෙන අසම්පූර්ණ ජීවිතයක් ගත කරන බවක් පෙනෙයි. අපගේ ජීවිතවලද, බොහෝ අඩුපාඩුකම්, බොහෝ කෙඳිරීම්, බොහෝ පසුබට වීම් ඇත. දෙවියන්වහනසේ සැබෑ ලෙස හඳුනාගැනීමෙන් පසුවත් අප තවමත් ඒ ආකාරයෙන්ම පසුවන්නෙමු. මෙය කණගාටුවට කරුණක් වන අතර ඉතා දුක්ඛිත / අසතුටුදායක තත්වයකි. එපමණක් නොව අප එයින් ජය ගැනීමට පවා උත්සහ නොගනී. මෙයද කණගාටුදායක තත්වයකි. එනමුත් අපගේ ජීවිතය අසම්පූර්ණව තිබියදී අප එය නොසලකා හැර අප අනෙක් අයගේ ජීවිතයේ අසම්පූර්ණ දේවල් සොයමින් කාලය ගත කරමින් ජීවත් වෙයි.

එහෙත් යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක: **"නුඹලා විනිශ්චය කරනු නොලබන පිණිස විනිශචය නොකරල්ලා. මක්නිසාද යම් විනිශ්චයකින් විනිශ්චය කරන්නොහුද, එයින්ම නුඹලාත් විනිශ්චය කරනු ලබන්නොහුය. යම් මිම්මකින් නුඹලා මැන දෙන්නහුද, එයින්ම නුඹලාටත් මැන දෙනු ලබන්නේය. නුඹේ ඇසේ තිබෙන දැවය නොසලකා නුඹේ සහෝදරයාගේ ඇසේ තිබෙන රොඩ්ඩ කුමකට බලන්නෙහිද? නොහොත් නුඹේම ඇසේ දැවය තිබියදීත් සහෝදරයාට කථා කොට නුඹේ ඇසේ තිබෙන රොඩ්ඩ පහ කරන්ට අවසර දියන්නැයි ඔහුට කෙසේ කියන්නෙහිද? වංචාකාරය, පළමුකොට නුඹේ ඇසෙන් දැවය පහ කරපන්න එවිට නුඹේ සහෝදරයාගේ ඇසෙන් රොඩ්ඩ පහකරන්නට නුඹට හොඳ හැටි පෙනෙන්නේය".** මෙම වචන වලින් උන්වහන්සේ අපට පෙන්වා දෙන්නේ අනෙකුගේ ජීවිතයේ අඩුපාඩුකම් හෝ අසම්පූර්ණකම් සොයන්නට පෙර අපගේ ජීවිතයේ ඇති අඩුපාඩුකම්,

අසම්පූර්ණකම් දෙස බලා ඒවා සම්පූර්ණ කර ගැනීමේ වැදගත්කමයි. දෙවියන්වහන්සේ පුද්ගලික ලෙස ඔබේ ජීවිතය දෙස බලන සේක. දෙවියන්වහන්සේට අවශ්‍යය කරන්නේ උන්වහන්සේ ඉදිරියෙහි ඔබගේ ජීවිතය ඔබ සම්පූර්ණව පවත්වා ගැනීමයි.

නමුත් අනෙකෙකුගේ ජීවිතය හෝ බයිබලයේ සඳහන් ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිතය අසම්පූර්ණව පවතින බැවින් එය අපට නිදහසට කරුණක් නොවේ. අද අපිට එය ආදර්ශයට ගැනීම නිශ්ඵල ක්‍රියාවකි. කුමක්හෙයින්ද අපට ආදර්ශයක් ලෙස අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව සිටි. ශුභාරංචි පොත් කියවීම මගින් උන්වහන්සේගේ ජීවිතය කොතරම් සම්පූර්ණ ජීවිතයක්ද කියා අපට දැක ගත හැක. උන්වහන්සේ කිසිසේත්ම කෙඳිරුවේවත්, දෙවියන්වහන්සේව දුකට හෝ විඩාවට පත් කළේවත් නැත. උන්වහන්සේ සම්පූර්ණ ජීවිතයක් ගත කල සේක. මෙය ඉතා හොඳින් **හෙබ්‍රෙව් 12:1-3** දක්වා කොටසින් අපට දැකගත හැක. **"එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා සියලු බරද, අප අසු කරන පාපයද, අහක දමා ඇදහිල්ලේ කතෘවරයාද, සම්පූර්ණකරන්නාද වූ යේසුස්වහන්සේ දෙසම බලමින් අප ඉදිරියේ තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. උන්වහන්සේ වනාහී තමන් ඉදිරියෙහි තබා තිබුණු ප්‍රීතිය නිසා ලැජ්ජාව නොසලකා කුරුසිය දරාගෙන පසුව දෙවියන්වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තෙහි වැඩ හිද ගත් සේක. ඒ නිසා නුඹලා නුඹලාගේ සිත් වලින් ක්ලාන්තවී වෙහෙස නොවන පිණිස තමන්ට විරුද්ධව සිටිය පව්කාරයන්ගෙන් එපමණ විරුද්ධකම් ඉවසූ තැනැන්වහන්සේ කල්පනා කර බලාපල්ලා".**

අපට අනෙකෙකුගේ ජීවිතය ආදර්ශයට ගැනීමට වඩා යේසුස්වහන්සේගේ ජීවිතය ආදර්ශයට ගැනීම තුලින් අපගේ ජීවිත සම්පූර්ණත්වයට ළඟාකර ගත හැක. උන්වහන්සේ සියල්ලේ සම්පූර්ණත්වය වන අතර අපගේ ජීවිත දෙවියන්වහන්සේගේ ප්‍රමිතියට දෙවියන්වහන්සේ තුල සම්පූර්ණ කර දෙන තැනැන්වහන්සේද වේ. හෙබ්‍රෙව් 12:1 හී එනම් ඇදහිල්ලේ කතුවරයාද, සම්පූර්ණ කරන්නාද වන යේසුස්වහන්සේව අපි ආදර්ශයට ගන්නා අතරම අනුගමනයද කළ යුතු වේ. එය අපගේ ජීවිත සම්පූර්ණ කර ගැනීමට හොඳම මාර්ගය වේ. අද අපි ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිතය මෙන් ජීවිතයක් ගත නොකරමු. අපි යේසුස්වහන්සේ ජීවත් වුණා වූ ආකාරයට ජීවත් වෙමු. මෙය අපගේ අභිප්‍රායත්, ආකල්පයත්, අධිෂ්ඨානයත් විය යුතුය. එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජීවත් වූ ආත්ම පූර්ණ ජීවිතයක් ගත කිරීමයි. උන්වහන්සේව අනුගමනය කිරීම මඟින් මෙය අපට ළඟා කරගත හැක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීම තුලින් අපගේ ජීවිත සම්පූර්ණ කර ගනිමු. එනම් අපගේ ආත්මික ජීවිතයත් අපගේ එදිනෙදා ජීවිතයත් උන්වහන්සේ දෙස බලා සම්පූර්ණ කර ගනිමු.

**- චාමර එරංග -**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවේ නායකයන් තුල තිබිය යුතු ගුණාංග.

**1. ආත්මික පරිනත භාවය.**
(1 තිමෝති 3:6)

**2. නිහතමානීභාවය.**
(ලූක් 22:24,26)

**3.ජීවිත පවිත්‍රකම.**
(ක්‍රියා 20:28 / 1 තිමෝති 3:7)
(මුදල්, ස්ත්‍රී, කතාබහ ආදිය)

**4. හැකියාව නොහොත් දක්ෂතාවය.**
(1 තිමෝති 3:2 / ක්‍රියා 20:28)

**5. නිතර සූදානම්ව සිටීම.**
(1 තිමෝති 3:2)

**6. ඒකත්වය.**
(එපීස 4:1 / ක්‍රියා 20:30)

**7. විවිධත්වය.**
(1 කොරෙන්ති 12:12 / ගලාති 2:9)

**8. පූර්ණ එකඟතාවය.**
(ක්‍රියා 15:25,28)

**9. විශ්වාසනීය භාවය.**
(හෙබ්‍රෙව් 13:17)

**11. අධිකාරීත්වය.**
(හෙබ්‍රෙව් 13:17,24)

**12. ප්‍රේමය.**
(1 කොරින්ති 16:14)

**- බයිබල් අධ්‍යනයක් ඇසුරෙනි -**

# උත්තරීතර වූ යේසුස්-වහන්සේගේ ආගම තුල ශ්‍රේෂ්ඨත්වය

1. ආබ්‍රහම්ට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (යොහාන් 8:53).

2. යාකොබ්ට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (යොහාන් 4:12).

3. සාලමොන්ට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (මතෙව් 12:42).

4. යෝනාට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (මතෙව් 12:41).

5. දේවදූතයන්ට වඩා උතුම්වූ යේසුස්වහන්සේ (හෙබ්‍රෙව් 1:4).

6. සියලු අනාගතවක්‍තෘවරුන්ට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (ලූක් 7:26).

7. යොහාන් බෞතීස්තට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (මතෙව් 11:11).

8. දේව මාලිගාවට වඩා උතුම්වූ යේසුස්වහන්සේ (මතෙව් 12:6).

9. අපේ සිතට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (1 යොහාන් 3:20).

10. සියල්ලට වඩා උතුම් වූ යේසුස්වහන්සේ (යොහාන් 3:31).

**- ජීවන හඬ -**

# අලුත් අවුරුදු උදාවීමේ දේව මෙහෙය

2018 නව වසර දෙවියන්වහන්සේගේ පාද පාමුල සිට අරඹන්න.

2017 දෙසැම්බර් 31 වන දින
රාත්‍රී 9.30 සිට නව වසර උදාව තෙක්
පැවැත්වෙන දේව මෙහෙයට ඔබත් එක්වන්න.

## නව වසරේදී ....

- දිනපතා බයිබලය කියවීමට
- දිනපතා යාච්ඤා කිරීමට
- සෑම ඉරුදිනකම සභාවට පැමිණීමට
- තම ආදායමෙන් දෙවියන්වහන්සේට කොටසක් වෙන් කිරීමට
- එක් දිනකදී එක් අයකුටවත් යේසුස්වහන්සේ ගැන සාක්ෂි දැරීමට

2018 නව වසරේ අපි අධිෂ්ඨාන කර ගනිමු.

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com

NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com